# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 09 ලාභ අරමුණු කර නොගත් සංවිධානයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1. පහත දැක්වෙන කුමන අයිතම, ක්‍රීඩා සමාජයක් විසින් පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංරචක ලෙස සැලකේද ?
   A. සාමාජික මුදල් ගිණුම
   B. මූල්‍ය තත්ව ප්‍රකාශය
   C. සමුච්චිත අරමුදල් ගිණුම
   D. ආදායම් සහ වියදම් ගිණුම
   E. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

   (1) A, B හා C
   (2) A, C හා E
   (3) A, B හා D
   (4) B, D හා E
   (5) A, C හා D

2. ලාභ අරමුණු කර නොගත් සංවිධානයක පහත තොරතුරු ලබා ගත හැකි ගිණුම් නම් කරන්න.

| තොරතුර | ගිණුම |
|---|---|
| A. වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් | ................................................ |
| B. වර්ෂය තුල මුදල් ගලා ඒම් සහ ගලා යාම් | ................................................ |

3. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්‍රීඩා සමාජයක සාමාජික මුදල් වලට අදාල තොරතුරු පහත දැක්වේ.
   2020/ 2021 වර්ෂය තුලදී ලද සාමාජික මුදල් වල සංයුතිය,

| වසර | රු. |
|---|---|
| 2019 / 2020 | 12,000 |
| 2020 / 2021 | 75,000 |
| 2021 / 2022 | 8,000 |
| | 95,000 |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

| | 2021.03.31 | 2020.03.31 |
|---|---|---|
| ලැබිය යුතු සාමාජික මුදල් | 18,000 | 20,000 |
| කලින් ලද සාමාජික මුදල් | ? | 12,000 |

2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් සාමාජික මුදල් ආදායම කොපමණද ?

4. ලාභ නොලබන ව්‍යාපාරයක් සම්බන්ධ පහත තොරතුරු සත්‍ය නම් (✓) ලකුණද අසත්‍ය නම් (×) ලකුණද යොදන්න.

A. වර්ෂ අවසාන දිනට සමුච්චිත අරමුදල වැඩි වීම තුලින් ආයතනයේ අතිරික්තයක් ලබා ඇති බව සැම විටම පෙන්වයි. ( )

B. වාර්ෂික සාමාජික ගාස්තු ආදායම, ලැබීම් හා ගෙවීම් ගිණුම තුලින් දැක ගත හැකිවේ. ( )

C. ක්‍රීඩා සමාජයක ක්‍රීඩා උපකරණ ණයට ගැනීම, වර්ෂ අවසාන දිනට මුළු වත්කම් ඉහල යාමට බලපායි. ( )

D. ලාභ නොලබන ආයතනයක් තම අරමුදල් ඉහළ නංවා ගැනීම සඳහා සංදර්ශණ පැවැත්වීම, ක්‍රීඩා තරඟ සංවිධානය වැනි දෑ සංවිධානය කරති. ( )

5. පහත තොරතුරු සුභ සාධක සමිතියකට අදාල වේ.

| විස්තරය | 2021.03.31 (රු'000) | 2020.03.31 (රු'000) |
|---|---|---|
| කාර්යාල උපකරණ (ශුද්ධ) | 1,000 | 850 |
| හිඟ සාමාජික මුදල් | 20 | 25 |
| බැංකු මුදල් | 60 | 60 |
| බැංකු ණය | 300 | 500 |
| කලින් ලද සාමාජික මුදල් | 15 | 10 |

ශුද්ධ වත්කම් ඇසුරෙන් 2020.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ ඌනතාවය කොපමණද ?

(1) රු. 340,000
(2) රු. 425,000
(3) රු. (145,000)
(4) රු. (340,000)
(5) රු. (425,000)

6. පහත තොරතුරු “සූර්යයා” ක්‍රීඩා සමාජයට අදාල වේ.

| | 2022.03.31 (රු'000) | 2021.03.31 (රු'000) |
|---|---|---|
| සමුච්චිත අරමුදල | 730 | 680 |
| යාවජීව සාමාජික අරමුදල | 225 | 250 |

යාවජීව සාමාජික අරමුදලෙන් 10 % ක් වාර්ෂික ආදායම ලෙස හඳුනා ගැනීම සමාජයේ ප්‍රතිපත්තිය වේ.
2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සූර්යයා ක්‍රීඩා සමාජයේ අතිරික්තය හෝ ඌනතාවය කොපමණද ?

(1) හිඟය රු.25,000
(2) අතිරික්තය රු. 50,000
(3) හිඟය රු. 50,000
(4) අතිරික්තය රු.75,000
(5) හිඟය රු.75,000

7. කුලඟන සමිතියක වත්කම් සහ වගකීම් පහත පරිදි වේ.

| විස්තරය | 2022.03.31 දිනට (රු'000) | 2021.03.31 දිනට (රු'000) |
|---|---|---|
| කාර්යාල උපකරණ (ධාරණ අගය) | 500 | 400 |
| හිඟසාමාජික මුදල් | 50 | 60 |
| අතැති මුදල් | 150 | 190 |
| දිගු කාලීන ණය | 200 | 300 |
| කලින් ලද සාමාජික මුදල් | 35 | 20 |

2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අතිරික්තය හෝ හිඟය කොපමණද?
(ශුද්ධ වත්කම් පදනම් කර ගන්න.)

(1) හිඟය රු. 45,000
(2) හිඟය රු. 135,000
(3) අතිරික්තය රු. 135,000
(4) අතිරික්තය රු. 150,000
(5) අතිරික්තය රු. 465,000

8. ක්‍රීඩා සමිතියක 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිටි සාමාජික සංඛ්‍යාව 150 කි. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 5,000 කි. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය තුලදී සමිතියට ලද මුදල් පහත පරිදි වේ.

- ප්‍රවර්තන වර්ෂය සඳහා ලද සාමාජික මුදල් රු. 500,000 කි.
- පරිත්‍යාග රු. 350,000
- 2022.03.31 දින කල්පිරුනු ස්ථාවර තැන්පතුවෙන් ලද මුදල් රු. 875,000 කි. (මින් 75,000 ක් පොලී ආදායම වන අතර 2021.03.31 දිනට ලැබිය යුතු පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.)

පරිත්‍යාග එය ලද වසරේ සිට වසර 5 ක් තුල සමාන වටිනාකම් වලින් ආදායමක් ලෙස හඳුනා ගැනීම සමිතියේ ප්‍රතිපත්තිය වේ.

ඉහත ගනුදෙනු නිසා 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් ආදායම සහ 2022.03.31 දිනට වත්කම් වල වැඩි වීම දක්වන්න.

9. 2022.03.31 දිනට ඉරහඳ ක්‍රීඩා සමාජයේ සාමාජික සංඛ්‍යාව 60 ක් වේ. සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික සාමාජික මුදල රු. 1,200 කි. 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල්

වාණිජ ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

ලෙස රු. 48,000 ක් මුදලින් ලැබුනි. 2022.03.31 සහ 2021.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් පිළිවෙලින් රු. 6,000 ක් හා රු. 9,000 ක් විය.

පහත දෑ ගණනය කරන්න.

A. 2022.03.31 න් අවසන් වර්ෂය සඳහා සාමාජික මුදල් ආදායම

B. 2022.03.31 දිනට හිඟහිටි සාමාජික මුදල

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව